සුවෙන් පෙරට

e ඉගෙනුම් පියස

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ZEOM

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

වාරය - II

| ශ්‍රේණිය : 6 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 7 - අලි උවදුර |
|---|---|---|

- **කතුවරයා පිළිබඳ විශේෂ කරුණු :**

- කුමාරතුංග මුනිදාස මහතා ප්‍රසිද්ධ ලේඛකයෙකි.
- එතුමා සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයෙහි විශාල පෙරළියක් සිදුකළ පඬිවරයෙකි
- හත් පණ, හින් සැරය, මඟුල් කෑම එතුමා විසින් රචිත ළමා ගද්‍ය කෘති වේ.
- කුමර ගී ළමා පද්‍ය කෘතියකි.
- අලි උවදුර කතාව උපුටා ගෙන ඇත්තේ එතුමා විසින් රචිත “කියවන නුවණ” කෘතියෙනි.

- **පාඩමේ අන්තර්ගතය කෙටියෙන් :**

- බඩගින්නට යමක් සොයමින් අලියෙක් ඇවිද එයි.
- රසයක් නැතත් ළග ගසක කොළ ටික ටික උා කමින් සිටියි.
- එවිට දිග හුවක් ඇසෙන්නට වෙයි.
- බියට පත් අලියා වේගයෙන් දුවයි.
- භයානක විශාල සිරුරක් ඇති සතෙකු වනයට පැමිණ ඇති බව ඌට දැක ගන්නට ලැබුණි.
- අලින්ට ලැබූ දශාව භයංකරය.

- **පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

(1). “මා යන්නට සිතා සිටි කුඹුර මගේ සිතින් ඇත් වියැ”

1. මේ කියමන කාගේද ?

..........................................................................................................................................

11. එසේ ප්‍රකාශ කිරිමට හේතුව කුමක්ද ?

..........................................................................................................................................

(2). අලියාට ඇසුණු හුවේ ස්වභාවය කුමක්ද ?

..........................................................................................................................................

(3). හූව එවූ සතා වනයට පිවිසියේ කෙසේද ?

..........................................................................................................................................

(4). “ඇසින් මහත් ආලෝකයක් නික්මී” මේ ඇස කුමක් ද?

..........................................................................................................................................

(5). සතාගේ දක්ෂිණාංශයේ වූ කටවල් සේ අලියා දුටුවේ මොනවාද ?

..........................................................................................................................................

(6). සතාගේ බොහෝ ගණනක් වූ පාද සේ අලියා දුටුවේ මොනවාද ?

.......................................................................................................................................

(7). අමුතු සතා හතිලන ආකාරය දක්වා ඇත්තේ කෙසේද ?

.......................................................................................................................................

(8). මේ අලියාගේ විස්තරයෙන් කියැවෙන විශාල සතා කවුරුන් විය හැකි ද ?

.......................................................................................................................................

(9). අලියා තම වාසයට වෙනත් වනයක් සොයා ගැනීම නුවණට හුරු යැයි කල්පනා කළේ කුමක් නිසා ද ?

.......................................................................................................................................

(10). පහත දී ඇති පදවලට සමානාර්ථ පද වරහන තුළින් තෝරා ලියන්න.

i. අන්ධකාර ......................................................................
ii. රාත්‍රිය ......................................................................
iii. වෘක්ෂය ......................................................................
iv. කට ......................................................................
v. බියකරු ......................................................................
vi. ගුවන ......................................................................
vii. කකුල් ......................................................................
viii. එළිය ......................................................................
ix. දකුණු පැත්ත ......................................................................
x. සිරුර ......................................................................

(භය, අහස, මුඛ, පාදයෝ, ගස, ආලෝකය, රෑ, දක්ෂිණාංශය, කළුවර, ශරීරය)

## <u>විශේෂණ පද</u>

කිසියම් පදයක් විස්තර කරමින් ඊට ඉදිරියෙන් යොදන පද විශේෂණ පද නමින් හැඳින්වේ.

උදා : <u>උස</u> ළමයා වේගයෙන් දුවයි.

ඉහත වාක්‍යයේ “ළමයා” යන නාම පදය හා දුවයි යන ක්‍රියා පදය විස්තර කිරීමට “උස, වේගයෙන්” යන පද පිළිවෙළින් යොදා ඇත. ඒ අනුව “උස, වේගයෙන්” යන පද විශේෂණ පද ලෙස හැඳින්වේ.

මේ අනුව විශේෂණ පද කොටස් දෙකකට වෙන් කළ හැකිය.

1. නාම විශේෂණ පද

2. ක්‍රියා විශේෂණ පද

- නාම විශේෂණ පද
  කිසියම් නාම පදයක් විස්තර කරමින් ඊට ඉදිරියෙන් යෙදෙන පද නාම විශේෂණ පද නම් වේ.

| | |
|---|---|
| **හොඳ** | ළමයා |
| විශේෂණ පදය | නාම පදය |

- ක්‍රියා විශේෂණ පද
  කිසියම් ක්‍රියා පදයක් විස්තර කරමින් ඊට ඉදිරියෙන් යෙදෙන පද ක්‍රියා විශේෂණ පද නම් වේ.

| | |
|---|---|
| වේගයෙන් | දුවයි. |
| විශේෂණ පදය | ක්‍රියා පදය |

(1). දී ඇති විශේෂණ පදවලට ගැළපෙන නාම පදය තෝරා යා කරන්න.

| | |
|---|---|
| 1. පාඩම් | වතුර |
| 2. ගුරු | මාර්ගය |
| 3. දළදා | දේශගුණය |
| 4. අධිවේගී | පොත |
| 5. ශීත | ගෙඩිය |
| 6. වැහි | දත් |
| 7. කළු | මල |
| 8. කුමුදු | ගෙදර |
| 9. කිරි | ජාතිකයා |
| 10. තැඹිලි | මාලිගාව |

(2). පහත සඳහන් නාම පද සඳහා ගැළපෙන විශේෂණ පද තෝරා ලියන්න.

1. ...................... දවසක්
2. ...................... හුවක්
3. ...................... ශරීරයක්
4. ...................... වලාකුළු
5. ..................... තාරකා

(දිග, කළු, මහත, කළුවර, දීප්තිමත්)

(3). පහත සඳහන් නාමපදවලට සුදුසු විශේෂණ පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න.

1. පාද -
   ........................................................................................................................
2. වනය -
   ........................................................................................................................
3. දිශාව -
   .......................................................................................................................
4. අහස -
   ........................................................................................................................
5. අලියා -
   ........................................................................................................................